**කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 - 2022**

---

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය අදියර 01 හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 02 හි II වගන්තියේ ආ.3 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

මූල්‍ය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු, නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත්වල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආයෝජන සැළසුම් සකස් කිරීම සඳහා සහාය වීම, නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැළපුම් දීමනාව ප්‍රදානය, කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යනාදී සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මකවේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 15,612.28 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 106.97 ක් වන අතර ඉන් රු.මිලියන 9,175.88 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 62.87 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 6,436.40 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 44.10 ක් ප්‍රතිලාභීන් විසින් සැපයීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු පසු මූල්‍යනය යටතේ 2016 ඔක්තෝම්බර් 15 දින ආරම්භ කරන ලද අතර, 2021 ඔක්තෝම්බර් 31 වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකමරු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුගත ප්‍රතිලාභී දායකත්වය හිමිකම් යටතේ නොපෙන්වා වගකීම් යටතේ වැරදියට දක්වා තිබුණි. | 16,556 | අනුරූප ණය ප්‍රවේශය, 2023 මූල්‍ය වර්ෂයේ සිට හිමිකම් වශයෙන් පෙන්විය හැකි ප්‍රතිලාභී දායකත්වය සහ ප්‍රදාන භාවිතය ලෙස පෙන්වා ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 39.8 ක් වූ ලෝක බැංකුවේ/අයිඩීඒ හි ණය ශේෂය, වාර්තා කරන දිනට ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනයකර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ ව්‍යාපෘති වියදම් ශේෂය අවතක්සේරුවී තිබුණි. | 6,830 | මෙම ගැළපීම පසුගිය වර්ෂ වලදී සිදු නොකළ අතර මෙම විගණනයේදී පෙන්වා දී ඇත. ඒ අනුව 2023 මූල්‍ය වර්ෂයේදී එම ගැළපීම සිදු කිරීමට අපි කටයුතු කරන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 පෙබරවාරි 07 දිනැති අංක 01/2022 දරන චක්‍රලේඛය. | අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් කාර්තුවකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ කිසිඳු රැස්වීමක් පවත්වා නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය වරින් වර අමාත්‍යාංශ කිහිපයක අධීක්ෂණය යටතේ සිදුකර ඇති අතර එම අමාත්‍යාංශ විසින් පවත්වනු ලබන සියලුම විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගීවී තිබේ. මේ වන විට ව්‍යාපෘතිය සඳහා වෙනමම විගණන කමිටු රැස්වීමක් පවත්වනු ලැබේ. | චක්‍රලේඛයෙහි දක්වා ඇති උපදෙස් වලට අනුකූල විය යුතුය. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 | ව්‍යාපෘති කාර්යමණ්ඩලය සේවයෙන් ඉවත්ව යනවිට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීම කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| | සංරචකය | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගැළපුම් දීමනාව | (i) | පහත සඳහන් ව්‍යාපෘති අරමුණුවලට අදාළව ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් නිකුත් කරන ලද ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. 2023 අප්‍රේල් 30 වන විට, සියයට 55 ට වඩා අඩු | සඳහන් කර ඇති පීඩීඕ හතරෙහි ප්‍රගතිය 2023 අප්‍රේල් 30 දිනට නිම කරන ලද උප ව්‍යාපෘති සංඛ්‍යාව මත පමණක් පදනම්ව තීරණය කර ඇත. 2023 අප්‍රේල් 30 දින වන විට නිම කරන ලද උප ව්‍යාපෘති සංඛ්‍යාව 630 කි. නියමිත ඉලක්ක සම්පූර්ණ කිරීමට අදාළ ඉහත දර්ශක (පීඩීඕ) ගණනය | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිශතයක් සපුරාගෙන ඇති ඉලක්ක හතරක් වසර 5ක ව්‍යාපෘති කාලය තුළ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී ඇති අතර ඉදිරි වසර එකහමාර තුළ එම අරමුණු ඉටුකර ගැනීමට හැකිවේද යන්න විගණනයට අවිනිශ්චිතය. | කිරීමට සමස්ථ උප ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 55ක් සමාලෝචනය කිරීමට උප ව්‍යාපෘති 758 ක් ඉතිරිව පවතී. කොවිඩ්-19 වසංගතය සහ මෑතකාලීන ආර්ථික අර්බුදය හා සම්බන්ධ ආරම්භක ප්‍රමාදයන් සහ අභියෝග හේතුවෙන් එම පීඩීඕ දර්ශක 4 පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කරන නමුත් 2023 වර්ෂයේ 2 වන කාර්තුවේ සිට ක්‍රමානුකූල දියුණුවක් පෙන්වයි. ඒ අනුව, උප ව්‍යාපෘති 758 අවසන් වූ විට, ඉදිරි මාස 20 තුළ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය මත පීඩීඕ හි අවසාන ඉලක්ක කරා ළඟා විය හැකිය. | |
| (ii) | ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු දුර්වල වීම හේතුවෙන්, ව්‍යාපෘතිය මඟින් ආයෝජකයින් වෙත ලබාදෙන ගැළපුම් දීමනාව, පළමු වාරිකය ලබාදුන් ආයෝජකයින් 263 දෙනෙකු වෙත ලබාදීමට නියමිතව තිබූ රු.මිලියන 1,023 ක් වූ දෙවන වාරිකය ලබාදීම ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ප්‍රමාද විය. තවද, පළමු වාරිකය සහ දෙවන වාරිකය ලබා දුන් ආයෝජකයින් 249 දෙනෙකු සඳහා තෙවැනි වාරිකය ලෙස ගෙවීමට තිබූ රු.මිලියන 389 ගෙවීම ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ප්‍රමාද විය. | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ආයෝජකයින් මුහුණ දෙන විවිධ ගැටලු ය. 2 වන වාරිකය නිකුත් කිරීම ව්‍යාපෘතියේ 1 වන වාරිකයේ ප්‍රගතිය මත පදනම්ව වෙනස් වන අතර අපේක්ෂිත ප්‍රතිශතය (ප්‍රදාන සහ ස්වකීය දායකත්වය) සපුරාලන තෙක් තවදුරටත් අරමුදල් නිකුත් කිරීමක් සිදු නොවේ. | නියමිත කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය. |
| (iii) | ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ වූ අතර ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කාලසීමාව 2024 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. ගැළපුම් දීමනාව ගෙවීමට ගතවන කාලය අනුව 2024 ජුනි වන විට, ආරම්භ කර නොමැති ව්‍යාපෘති 1,405ක් සඳහා ගැළපුම් දීමනාව ලෙස රු.මිලියන 3,727ක් ගෙවීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. | විගණන වාර්තාවේ, 2023 අප්‍රේල් 30 දිනට ගෙවිය යුතු ඉතිරි ගැළපුම් දීමනාව රු.මිලියන 3,727 ක් ලෙස සඳහන් කළද එය රු.මිලියන 3,015 ක් වේ. අද වන විට පවතින මුළු උප ව්‍යාපෘති සංඛ්‍යාව 1,388 කි. 2023 ජුනි 30 වන විට පීඑම්යූ විසින් ගැළපුම් දීමනාවෙන් දැනටමත් රු.මිලියන 236.3 ක් ලබාදී ඇත. එබැවින් ලබා දීමට ඉතිරිව ඇති මුළු ගැළපුම් දීමනාව රු.මිලියන 2,779 කි. මෙම මුදලින් රු.මිලියන 620.7ක් ආරම්භ කිරීමට නියමිතව ඇති රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවතින විශාල කවුළු ව්‍යාපෘති 12ක් | නියමිත කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සඳහා වෙන් කර ඇත. රු.මිලියන 2158.3 ක් වූ ඉතිරි ගැළපුම් දීමනා මුදල 2024 ජුනි 30 වන දිනට එනම් ව්‍යාපෘතිය දීර්ඝ කිරීමේ දින වන 2024 දෙසැම්බර් 31 දිනට මාස හයකට පෙර ලබා දීමට ව්‍යාපෘති කළමණාකරණ ඒකකය(PMU) විසින් සැළසුම්කර ඇත. | |
| | | (iv)ඊඕඅයි/2020/03/771 යටතේ 2021 මැයි 19 සහ 2022 මාර්තු 02 යන දිනයන්හිදී රු.මිලියන 4ක ගැළපුම් දීමනා මුදල කම්හලකට ලබා දී තිබූ අතර, 2022 දෙසැම්බර් 31 වන විටත් නිෂ්පාදනය ආරම්භ කර නොතිබුණි. | කලණ ෆයිබර් මිල් (පුද්ගලික) සමාගමේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු 2023 ජනවාරි 23 දින ආරම්භ කරන ලද අතර නිෂ්පාදන ක්‍රියාවලිය සාර්ථකව සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| | | (v) 2017, 2018 සහ 2019 යන වර්ෂයන්හිදී එකතුව රු.මිලියන 85.72 ක් වූ ගැළපුම් දීමනා ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හැර දැමූ සමහර සමාගම් වෙත නිකුත් කර තිබුණි. එම ආධාර මුදල් ආපසු ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආපසු ගෙවා ඇත්තේ රු.මිලියන 49.48ක් පමණි. ඉතිරි මුදල වන රු. මිලියන 36.25 සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකරගත යුතුව තිබුණි. | ඉතිරි මුදල වන රු.මිලියන 36.997 ක වටිනාකම යෝජකයින් 4 දෙනෙකුගෙන් අයකර ගැනීමට පියවර ගෙන ඇත. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | පොකුරු ව්‍යාපෘති | (i) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2019/021/1/02-04 මගින් පොකුරු ව්‍යාපෘති 41 ක් ක්‍රියාත්මක කිරීම අනුමත කර තිබූ අතර, ක්‍රියාත්මක කර තිබුණේ එෆ්පීජී/සීඹ/2022/2/24 දරන පොකුරු ව්‍යාපෘතිය පමණි. | පීඑම්යූ විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අංක 2019/021/1/02/-04 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති පොල් වගා කිරීමේ මණ්ඩලයේ (සීසීබී) සහ පොල් සංවර්ධන අධිකාරියේ (සීඩීඒ) නිර්දේශ මත පදනම්ව සිදුකර ඇත. 'කප්රුක සමිති' යටතේ පොකුරු ව්‍යාපෘති 41ක් අනුමත කර ඇතත් පසුව සීසීබී/සීඩීඒ විසින් නිර්දේශ කරන ලද එෆ්පීජී/සීඹ/2020/2/24 දරන එක් නියමු පොකුරු කණ්ඩායමක් පමණක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. | කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ii) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2019/021/1/02-04 යටතේ වූ එෆ්පීජී/සීඕ/2020/2/24 දරන පොකුරු ව්‍යාපෘතිය හරහා පලන්තිරියාගොඩ එකමුතු කප්රුක සමිතියේ සාමාජිකයින් 50 දෙනෙකු සඳහා රු.700,000 ක් වටිනා ලණු ඇඹරුම් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන ඇතත්, 2020 නොවැම්බර් 25 වන දින රු.120,000 බැගින් අනුමත කරන ලද කණ්ඩායම් ඉක්මවා පුද්ගලයන් 202 දෙනෙකුට රු.මිලියන 2 ක මුදලක් බැරකර තිබුණි. දකුණු පළාත් ගැළපුම් දීමනා කළමනාකරු විසින් ලණු නිෂ්පාදන සම්බන්ධයෙන් නිර්මාණය කරන ලද ව්‍යවසායකය පොකුරේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම සිදුකර නොතිබුණි. | පලන්තිරියාගොඩ එකමුතු කප්රුක සමිතියට අයත් නොවන සාමාජිකයින් 50 දෙනෙකු සඳහා රු.700,000 ක ගැළපුම් දීමනා වෙන්කර ඇති බව විමසුමෙහි දක්වා තිබුණද, එය සාමාජිකයින් 202ක් සඳහා වූ රු.2,828,000 ක ගැළපුම් දීමනාවක් ලෙස විය යුතුය. අර්ධ ස්වයංක්‍රීය නූල් සාදන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මෙම මුදල සමිතියට ලබා දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරන අවස්ථාවේදී, මෙම පොකුරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අධීක්ෂණ කටයුතු සීසීබී/සීඩීඒ සහ කප්රුක සමිතිය විසින්ම සිදු කිරීමට තීරණය කරන ලදී. දකුණු පළාත් ගැළපුම් ප්‍රදාන ඒකකයේ ඇති අධික වැඩ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, ප්‍රදාන කළමනාකරු විසින් සීසීබී/සීඩීඒ හි අධීක්ෂණයත් සමඟ සම්පූර්ණ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී. | අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම | කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීමට ඇමෙරිකානු ඩොලර් මිලියන 7.12 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 වන දින දක්වා එය භාවිතාකර නොමැති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය විසින් කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු නියෝජිතයන් සමඟ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ඇති අතර පරිපාලන විධිවිධානවල ඇති ගැටලු හේතුවෙන් අදාළ බැංකු විසින් එම ක්‍රියාමාර්ගය ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා වෙන් කර ඇති ඇ.ඩො. මිලියන 7.12 ක වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණයෙන්ම පාලනය කර අධීක්ෂණය කරනු ලැබේ. පරිපාලන ගැටලු හේතුවෙන් වාණිජ බැංකු මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අකමැත්තක් දක්වයි. එබැවින්, වෙන් කරන ලද මුදල සංශෝධනය කරන ලද අතර, මුළු ප්‍රතිපාදනවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1.00 ක මුදලක් ඉතිරි කර ඇමෙරිකානු ඩොලර් මිලියන 6.12 ක් ගැළපුම් දීමනා යෝජනා ක්‍රමයට මාරු කරන ලදී. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය. |

## 3.2 ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේදී රු.867,000 ක අතිරේක වියදමක් දරමින් ජීඅයිඑස් මෘදුකාංගයට අයත් ඩෙස්ක්ටොප් අවකාශීය විශ්ලේෂක දිගුව හා ඩෙස්ක්ටොප් 3ඩී විශ්ලේෂක දිගුව යන මොඩියුල් දෙක මිලදීගෙන ඇතත් මෙම මොඩියුලයන්හි ප්‍රයෝජනය හඳුනාගෙන නොතිබුණු අතර භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | 2017 වර්ෂයේදී, ඒස්එම්පී විසින් දිගු දෙකකින් සමන්විත කාර්යය සඳහා වඩාත් සුදුසු සම්පූර්ණ පැකේජය වෙනුවට ජීඅයිඑස් මෘදුකාංග (ArcGIS ඩෙස්ක්ටොප් උසස් බලපත්‍රය 10.5.1) පැකේජය ලබා ගැනීමට තීරණය කර ඇත. උක්ත දිගු දෙක ව්‍යාපෘතියේ අවසාන අදියරේදී භාවිතා වේ. සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා මෙම දිගු දෙක සහිත පැකේජ භාවිතා කිරීම අවශ්‍ය වේ. ව්‍යාපෘතියේ අවසාන කොටසේදී දිගු දෙකක් මිලදී ගැනීමට සැලසුම් කළේ නම්, මූලික පිරිවැයට සාපේක්ෂව මිල අධික දිගු එකතු කිරීමට ගැළපෙන පරිදි ArcGIS වේදිකාව නව අනුවාදයකට යාවත්කාලීන කිරීමට සිදුවේ. | ව්‍යාපෘතිය පරමාර්ථය සමඟ සමපාත විය යුතු අතර දත්ත පද්ධතිය යාවත්කාලීනව භාවිතා කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භකර වසර 5 ක් ගතවීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට උපයෝජනයකර ඇතත් ණය දෙන නියෝජිතායතනය විසින් දෙන ලද රු.මිලියන 8,869.38 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 61.19 ක් වන මුළු ප්‍රතිපාදන වලින් සියයට 65 ක් නියෝජනය කරන එකතුව රු.මිලියන 7,634.37කට සමානවූ ඇමරිකානු ඩොලර් මිලියන 39.84 ක මුදලක් පමණක් බව නිරීක්ෂණය විය. | වෙන් කර ඇති ප්‍රදාන මුදල සහ දරන ලද වියදම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.<br><br>ඇ.ඩො.මි.<br>වෙන් කර ඇති මුළු ප්‍රදාන මුදල 61.19<br>2022/12/ 31 දිනට වියදම 39.84<br>මුදල් අමාත්‍යාංශය විසින් වෙන්කිරීම් අවලංගු කිරීම 10.00<br>2022/12/31දිනට පවතින ශේෂය 11.35<br><br>ව්‍යාපෘති කාලය 2024/12/ 31දක්වා දීර්ඝ කර ඇති බැවින් ඉතිරි ශේෂය වන ඇමරිකානු ඩොලර් 11.35 ඉතිරි කාලය තුළ භාවිතා කළ හැක. | අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසි ලෙස සැළසුම් කළ යුතුය. |